057532
FAL/PR
2019/07/

# රයිගම් කෝරළයේ ශාන්තිකර්ම

## (මඬු ශාන්තිකර්ම පිළිබඳ විශේෂ අධ්‍යනයක්)

සිගාමිණී මුහන්දිරම් මනෝරි ගංගා අබේරත්න
DD/MP/DA/08/038
සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයීය
පශ්චාද් උපාධි කේන්ද්‍රය
ප්‍රාසංගික කලාපති දෑ අවුරුදු උපාධිය (M.P.A.)
2016 පෙබරවාරි

057532

පුස්තකාලය

# ප්‍රවේශය.

කුතුහලයෙන් පරිසරය දෙස බලන්නට විමසිලිමත්ව ගවේෂණශීලීව ලොව දෙස බලන්නට මිනිසා නිබඳව ම උත්සුක වේ. මිනිස් ඉතිහාසය යනු ඔහු නවීනත්වය සොයා කළ අරගලයෙහි පිය සටහන් පෙළයි. අවසානයේ එහි ප්‍රතිඵලය ලෙස නව දැනුම මිනිසාගේ ඥානකෝෂයට දින දින එක්වෙයි. නවීන දැනුමට ඇලුම් කිරීමටත් ඒ සමඟ ජීවත් වීමටත් මිනිසා ස්වභාවිකවම පෙළඹෙයි. ඒ අනුව සම්ප්‍රදායක පැරණි දැනුම් පද්ධතීන් අබිබවමින් නව දැනුම බිහිවූ විට ඉපැරණි දෑ ක්‍රම ක්‍රමයෙන් අභාවයට යයි. එය මිනිස් ස්වභාවයයි.

එනමුදු ඇතැම් දැනුම් පද්ධති අභාවයට ගියේ සංස්කෘතික හා පාරිසරික අර්බුදවලට ප්‍රතිඵලයක් ලෙසින් පමණක් ම නොව විවිධ ආක්‍රමණ හා ස්වභාවික විපත් ඊට මුල් විය. එබැවින් ලොව ඉතා දියුණුව පැවති ශිෂ්ටාචාර පවා මුළුමනින් ම වැළලී ගියේ ය. මේ අතරින් අප රට වඩාත් ලක්වූයේ සතුරු ආක්‍රමණික අභියෝග වලටය. එමගින් අප සතු දෑ බොහෝ අපට අහිමි කළේය. එසේම අප සතු දෑ පහත් කර සැලකීමේ මානසිකත්වක් ද අප තුළට නිර්මාණය වූයේ යටත් විජිත මානසිකත්වයෙහි ප්‍රතිඵලයක් ලෙසිනි.

මේ නිබන්ධයේ දී අවධාරණය කරනු ලබන්නේ අප සමාජයෙන් ගිලිහී යන එක් ක්ෂේත්‍රයක් පිළිබඳව ය. සිංහලයාට ආවේණික වූ විවිධ සංස්කෘතිකාංග, විද්‍යාත්මක හා තාක්ෂණිකාංග මෙන්ම විශ්වාස පද්ධතියක් ද වෙයි. මේ අතරින් රයිගම් කෝරළයේ අතීතයේ විශ්වාස පද්ධතියක් ද වෙයි. මේ අතරින් රයිගම් කෝරළයේ අතීතයේ සිට වර්තමානයේ ද නොනැසී පවතින විවිධ වූ ඇදහිලි හා විශ්වාසයන් පිළිබඳ මෙහි දී විමර්ශනය කෙරේ. නවීනත්වය කරා ගමන් කරන ලෝකය තුළ මෙම විශ්වාසයන්ට හිමි වනුයේ අවතක්සේරුවකි. ශාන්තිකර්ම සමග වූ විශ්වාසයන් බටහිර විද්‍යාත්මක චින්තනය විසින් මිත්‍යාවක් ලෙස බැහැර කිරීම නිසා බටහිර මානසිකත්වයට යටත් වූ අප සමාජය ඒවා නිරායාසයෙන් ප්‍රතික්ෂේප කර ඇත. කෙසේ වෙතත් මේ වන විට පෙරදිග භාවනා, යෝගී ක්‍රම, පුද පූජා ආදී මානසික ව්‍යායාම කෙරෙහි බටහිර උගතුන්ගේ අවධානය සීඝ්‍රයෙන් මිනිසාට ලංවීමත් පෙන්නුම් කෙරේ.

මේ නව තත්ත්වය ශාන්තිකර්ම සම්බන්ධයෙන් ද සාකච්ඡාවට ලක් වේ. සමාජ මානව විද්‍යා විෂය ක්ෂේත්‍රයන්හි විද්වතුන් ශාන්තිකර්ම සමාජ අවශ්‍යතාවයක් ලෙස සළකයි. දියුණු මනෝ විද්‍යාත්මක මූල ධර්මයක් ලෙස ශාන්තිකර්ම පවත්වා ගෙන යති.

මෙම නිබන්ධය මාතෘකාව පිළිබඳ හැඳින්වීමකින් හා පරිච්ඡේද 5 කින් යුක්ත වේ. පළමු පරිච්ඡේදයේ දී රයිගම් කෝරළයේ භූගෝලීය, සමාජයීය, සංස්කෘතික පසුබිම විස්තර කරන අතර දෙවන පරිච්ඡේදයේ දී රයිගම් කෝරළයේ ඇදහිලි හා විශ්වාස සහ පුද ලබන දෙවි දේවතාවෝ සහ යක්ෂ කොට්ඨාශයන් විස්තර කරයි. තුන්වන පරිච්ඡේදයේ දී ශාන්තිකර්ම හැඳින්වීම ශාන්තිකර්මයන්හි ඓතිහාසික හා සමාජයීය පසුබිම, දේශීය ශාන්තිකර්ම පද්ධතිය සාකච්ඡාවට බඳුන් වේ. හතරවන පරිච්ඡේදයෙන් ජන ජීවිතය හා ශාන්තිකර්ම, ගම්මඩුව, පුනාමඩුව, ගරායකුම, බලියාගය, සූනියම් කැපීම, සන්නියකුම් යාගය විස්තර කරයි. රයිගම් කෝරළයේ ශාන්තිකර්ම හා සම්බන්ධ පරම්පරා පිළිබඳ පස්වෙනි පරිච්ඡේදයෙන් විස්තර කරයි.